# අනගාරික ධර්මපාල දැක්ම ජාතික සංවර්ධනය සඳහා දායක කරගත හැක්කේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යයනයක්

**චාලිකා සසිකානි තංගරාජා [1], බී. හසිතා දිල්රුක්ෂි විමලසිරි [2]**
*[1,2] ජනමාධ්‍ය ඒකකය, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*
*[1*]sasikanic@yahoo.com, [2*]hasithawimalasiri@gmail.com*

'සංවර්ධනය' යන සංකල්පය සමස්ත ජාතියක වර්ධනය සඳහා මෙන්ම ස්ථාවරත්වය සඳහා ද ඍජුව අදාළ වන්නකි. සංවර්ධනයක් අත්පත් කර ගත් රාජ්‍ය කෙරෙහි බල පැවැත්වෙන ප්‍රධාන නිර්නායකයක් වනුයේ එහි වෙසෙන පුරවැසියාගේ ජීවන තත්ත්වය වඩාත් ගුණාත්මක එකක් වීමයි. මෙම සංවර්ධිත ස්වභාවය හඳුනාගනු වස් ජගත් මට්ටමින් උපයෝගී කරගනු ලබන දර්ශකයන් වේ. එවැනි සංවර්ධන දර්ශකයන්ට අනුව ශ්‍රී ලංකාව යනු සංවර්ධනය වෙමින් පවත්නා රාජ්‍යයකි. එහිදී, ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු අතර ඒ සඳහා විවිධ අර්ථදායී ක්‍රමෝපාය මාර්ගයන් අනුගමනය කළ යුතුව තිබේ. ඒ ඔස්සේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් සඵලදායී එකක් කරගැනීම සිදු කළ හැකිය. එම ජාතික සංවර්ධනය සමීප කරගැනීමේ කාර්යයේදී උත්පාදනය වන සංවර්ධන ගැටලු නිරාකරණය කරගැනීම පිණිස විවිධ සංකල්ප, ආකෘති හා විචාර පූර්ව දැක්ම උපයෝගී කරගත හැකි වේ. අනගාරික ධර්මපාලතුමාගේ දැක්ම ජාතික සංවර්ධනය සඳහා දායක කරගත හැකි ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා මෙම පර්යේෂණය සිදුකර ඇත. ඒ අනුව මෙහි පර්යේෂණ ගැටලුව වන්නේ 'ජාතික සංවර්ධන කාර්යයේදී අනගාරික ධර්මපාලතුමාගේ දැක්ම උපයෝගී කරගත හැක්කේ කෙසේද?' යන්න යි. ජාතික සංවර්ධනය පිළිබඳ ක්‍රියාවලියේදී උත්පාදනය වන ගැටලු සඳහා අනගාරික ධර්මපාල දැක්ම ඍජුව දායක කරගත හැකි ආකාරයේ සැලසුම් සකස් කරන්නේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමට ද අපේක්ෂිත ය. ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර යොදා ගනිමින් සිදුකර ඇති මෙම පර්යේෂණය සඳහා පර්යේෂණ ක්‍රමවේදය ලෙස අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය යොදා ගැනිණි. එහිදී ගුණාත්මක දත්ත විශ්ලේෂණය සිදුකර තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් නිගමන කිහිපයකට එළඹීමට හැකි විය. ජාතික සංවර්ධන කාර්යයේදී ධර්මපාල දැක්ම සඵලදායී වශයෙන් උපයෝගී කර ගත හැකි බව ප්‍රධාන නිගමනයකි. එමගින් ජාතික සංවර්ධන ක්‍රියාවලිය සඳහා සැලසුම් සකස් කිරීම සිදු කළ හැකි බවත්, ඒ ඔස්සේ සංවර්ධන ගැටලු නිරාකරණය කරගැනීමට අවශ්‍ය පසුබිම සකසා ගත හැකි බවත් මෙහිදී නිගමනය කළ හැකි විය.

මුඛ්‍ය පද ඃ ජාතික සංවර්ධනය, සංවර්ධන සැලසුම්, සංවර්ධන ගැටලු දැක්ම, සංවර්ධන සංකල්ප